2.2.2 පුංචි අපටත් පරිගණක ආචාර ධර්ම

පරිගණකය හොඳින් පරිහරණය කිරීම පරිගණක ආචාර ධර්ම වේ.

1) ඔබ විසින් පරිගණක විද්‍යාගාරය භාවිතයේදී පිළිපැදිය යුතු ආචාර ධර්ම සඳහා හරි " √ " ලකුණත් එසේ නොවන ඒවා සඳහා වැරදි " x " ලකුණත් යොදන්න.

1. පරිගණක විද්‍යාගාරය තුළ දුව පැන සෙල්ලම් කිරීමෙන් වළකින්න (------)
2. පරිගණක විද්‍යාගාරයේ ද්‍රව්‍ය පිටතට රැගෙන යා යුතුය. (------)
3. පරිගණක භාවිතා කරන අතරතුරේ ආහාර පාන ගැනීමෙන් වැළකිය යුතුය (------)
4. ගුරුභවතුන්ගේ අධීක්ෂණයෙන් තොරව අන්තර්ජාල භාවිතය නොකළ යුතුය (------)
5. පරිගණක විද්‍යාගාරයට පේළියට පැමිණිය යුතුය. (------)

2) පරිගණක විද්‍යාගාරය තුළ ප්‍රදර්ශනයට සුදුසු නීති ඇතුළත් පෝස්ටරයක් සකස් කරන්න.